සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2021-03-14
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, අවිධිමත් සංවිධානයක් (informal organization) සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) අලෙවිකරණ දෙපාර්තමේන්තුව.
(2) මුහුණුපොතේ සංවාද කණ්ඩායමක් (chat group).
(3) ශ්‍රී ලංකා මහ බැංකුව.
(4) සෞඛ්‍ය අමාත්‍යාංශය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, විධිමත් ව්‍යාපාරයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) ආර්ථික කටයුත්තක් තිබීම.
(2) අඛණ්ඩ ක්‍රියාවලියක නිරත වීම.
(3) අවධානමක් සහ අවිනිශ්චිතතාවයක් නොමැති වීම.
(4) ලාභයෙන් අභිප්‍රේරණය වීම.

**1.3** ව්‍යාපාරික සංවිධානයන් පෞද්ගලික සහ පොදු (රාජ්‍ය) සංවිධාන ලෙස වර්ගීකරණය කිරීමේ පදනම, පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) නිෂ්පාදනයේ ස්වභාවය.
(2) අරමුණ.
(3) ප්‍රමාණය.
(4) හිමිකාරිත්වය.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාර ආචාර ධර්මවලට පටහැනිව කටයුතු කරන අවස්ථාවක් වන්නේ:

(1) තරඟකාරී ව්‍යාපාරයක තොරතුරු සොරා ගැනීම.

(2) නොමඟ යවන සුළු පණිවුඩ නිකුත් කිරීම.

(3) ව්‍යාපාරයක රහසිගත තොරතුරු බාහිර පාර්ශවයකට විකිණීම.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, ආයතනික සමාජ වගකීමෙහි [Corporate Social Responsibility (CSR)] ප්‍රතිලාභයක් **නොවන්නේ** කුමක් ද?

(1) එය අනාගත ඇල්මැති පාර්ශවයන් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වේ.

(2) එය ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය කරනු ලබයි.

(3) එමඟින් ලාභ චේතනාව කෙරෙහි බාධාවක් ඇතිකරනු ලබයි.

(4) එමඟින් පාරිභෝගික සම්බන්ධතා සංවර්ධනය කරනු ලබයි.

**1.6** සේවාවන් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** සේවාවන් අස්පෘශ්‍ය වේ.

**(b)** සේවාවන් ගබඩාකර තබා පසුව භාවිත කළ හැකිය.

**(c)** සේවාවන් නිපදවීම සඳහා බහුලව ශ්‍රමය යොදාගනු ලැබේ.

**(d)** සේවාවක් නිෂ්පාදනය සහ පරිභෝජනය එකම අවස්ථාවක සිදුවේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශ වනුයේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(c)** සහ **(d)** පමණි.

(3) **(a), (b)** සහ **(c)** පමණි. (4) **(a), (c)** සහ **(d)** පමණි.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, බද්ධ ව්‍යාපාරයක (Joint Venture) ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් සහභාගී වීම.

(2) දිගුකාලීන අරමුණක් ඉටුකර ගැනීම සඳහා වූ දිගුකාලීන ව්‍යාපෘතියක් ඇතුළත් වීම.

(3) ලියාපදිංචිය අවශ්‍ය නොවීම.

(4) වෙන් වූ නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (Real Time Gross Settlement System) සහභාගිකරුවෙක් **නොවන්නේ** කවුරුන් ද?

(1) බලපත්‍රලාභී වාණිජ බැංකු. (2) ශ්‍රී ලංකා මහ බැංකුව.

(3) සේවක භාරකාර අරමුදල. (4) සේවක අර්ථසාධක අරමුදල.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා අවශ්‍යවන ලියවිල්ලක් **නොවන්නේ** කුමක් ද?

(1) අධ්‍යක්ෂකවරුන්ගේ කැමැත්ත දක්වන ප්‍රකාශය.

(2) සාංගමික ව්‍යවස්ථාවලිය.

(3) පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන.

(4) ලේකම්ගේ / ලේකම්වරුන්ගේ කැමැත්ත දක්වන ප්‍රකාශය.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයක් [Small and Medium Sized Enterprise (SME)] අසමත් වීම සඳහා හේතුවක් වන්නේ කුමක් ද?

(1) කළමනාකරණ කුසලතා නොමැති වීම.

(2) ව්‍යවසායකත්ව සංස්කෘතියක් සංවර්ධනය කිරීම.

(3) පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල ආයෝජනය කිරීම.

(4) මනා කාරක ප්‍රාග්ධන කළමනාකරණය.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** රැකියා සුරක්ෂිතභාවය (job security) වුවමනාවක් (want) සඳහා උදාහරණයකි.

**1.12** සීමිත පොදු සමාගමක සිටිය හැකි උපරිම කොටස්හිමියන් සංඛ්‍යාව 50 කි.

**1.13** මනෝවිද්‍යාත්මක සාධක (psychological factors), සඵලදායී සන්නිවේදනයට බාධා (barriers) ලෙස ක්‍රියා කරයි.

**1.14** කේවලස්වාමි ව්‍යාපාරයක වගකීම සීමාසහිත වේ.

**1.15** සමාගමක කොටස් හෝ ණයකර සඳහා සහභාගී වන මෙන් පොදු මහජනතාව වෙත ආරාධනා කරනු ලබන ලියවිල්ල, සංස්ථා ප්‍රකාශය (prospectus) ලෙස හඳුන්වනු ලැබේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** හවුල් ව්‍යාපාරයක මූලික ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** "තිරසාර පරිසරය (Environmental Sustainability)" යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** රජයේ අරමුණු (objectives) දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** සේවකයන් කෙරෙහි ආයතනික සමාජ වගකීම ඉටුකිරීමෙහිලා සංවිධානයකට අනුගමනය කළහැකි පියවර (steps) දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** චෙක්පතක මූලිකාංග (elements) දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස
(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

ව්‍යාපාර උපකාර සේවාවන්, කුඩා පරිමාණ සංවිධානයන්ගේ සිට මහා පරිමාණ සංවිධානයන් දක්වා ඉතාමත් වැදගත් අංගය බවට පත්ව ඇත. ඒවා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඵලදායිව සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමටත්, විසඳුම් දීමටත් සංවිධානවලට සහාය වේ. මෙම උපකාරක සේවාවන්ට මුදල්, රක්ෂණය, සන්නිවේදනය, සැපයුම් සේවා සහ ප්‍රවාහනය ඇතුළත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මුදලේ කාර්යයන් (functions) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) රක්ෂණයේ මූලධර්ම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ව්‍යාපාර සංවිධානයකට රක්ෂණය වැදගත් වීමට හේතු (reasons) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)
(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**සීමාසහිත MN (පෞද්ගලික) සමාගම (MN),** බෝතල් කළ පළතුරු ජෑම් නිෂ්පාදනය කරන මහා පරිමාණ දේශීය සමාගමක් වන අතර එහි ගොවිපොළ සහ නිෂ්පාදන කම්හල දකුණු පළාතේ පිහිටා ඇත. මෑතකදී **MN සමාගමට** මාලදිවයිනේ පිහිටි සුපිරි වෙළෙඳසැල් දාමයකින් ජෑම් බෝතල් සැපයීම සඳහා ඉල්ලීමක් ලැබී ඇත. **MN සමාගමේ** කළමනාකාර අධ්‍යක්ෂ **හේමාලි මහත්මිය,** එහි නිෂ්පාදිතවල ගුණාත්මකභාවය සහ බෙදාහැරීමේ මාධ්‍යයන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාවන් පිළිබඳ සලකා බලමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මනා ලෙස කළමනාකරණය නොකළ බෙදාහැරීමේ මාධ්‍යයක් (distribution channel) පැවතීමේ අවාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) හොඳ බෙදාහැරීමේ මාධ්‍යයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු සාධක තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(c) ව්‍යාපාරයක් ගෝලීය වශයෙන් පුළුල් කිරීමට අවශ්‍යවන හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

අධ්‍යාපන අමාත්‍යාංශයේ උප ලේකම් වන **අර්ජුන් මහතා,** ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතිය තුළ ව්‍යවසායක අධ්‍යාපනයක් ඇති කිරීම වෙනුවෙන් ඇමරිකානු ඩොලර් ($) මිලියන 5 ක ජාත්‍යන්තර ප්‍රදානයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ යෝජනාවක් සැකසීමට අදහස් කරයි. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී මුහුණපාන ගැටළු පිළිබඳ **අර්ජුන් මහතාට** මනා අවබෝධයක් ඇති අතර, අනාගත ව්‍යවසායකයන්ට අවශ්‍ය සම්පත් ලබා දීම සඳහා දේශීය සහ විදේශීය සංවිධාන දිරිමත් කිරීමට ඔහු සැලසුම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යවසායකයෙකු සතු ලක්ෂණ (characteristics) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) ශ්‍රී ලංකා ආර්ථිකයට ව්‍යවසායකත්වය (entrepreneurship) වැදගත් වීමට හේතු (reasons) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**වෛද්‍ය ගුණදාස මහතා,** 1990 සිට මධ්‍යම පළාතේ ප්‍රසිද්ධ ආයුර්වේද වෛද්‍යවරයෙකි. ඔහුට මහනුවර නගරයේ දේශීය ආයුර්වේද රෝහලක් ඇති අතර, එහි කළමනාකරණ කටයුතු ඔහුගේ වැඩිමල් පුත් **ආසිරි** විසින් සිදුකරනු ලබයි. ඔවුන්ගේ ආයුර්වේද රෝහලේ ප්‍රමුඛතම කාර්යයක් වනුයේ ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය ඉහළින්ම පවත්වා ගැනීම වේ. මහනුවර නගරයේ සංචාරය කරනු ලබන විදේශිකයන් විවිධ වූ ආයුර්වේද ප්‍රතිකාර සඳහා මෙම රෝහලට පැමිණෙනු ලැබේ. මෑතකදී **ආසිරි** විසින් ව්‍යාපාර කළමනාකරණ උපාධිය සම්පූර්ණ කරනු ලැබූ අතර, පියාගේ ව්‍යාපාරය තවදුරටත් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පුළුල් කිරීමට ඔහු විසින් සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සංවිධානයෙහි ඇල්මැති පාර්ශව (stakeholders) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) "ආයුර්වේද රෝහලේ" කළමනාකරණය විසින් පරිසර දූෂණය වැළැක්වීමට ගතහැකි පියවරයන් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුකරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් [Medium Sized Enterprises (SMEs)] මුහුණදෙන අභියෝග (challenges) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත Refresh සමාගම** සතුව බස්නාහිර පළාත තුළ අලෙවිසැල් 40 කින් යුත් සුපිරි වෙළෙඳසැල් දාමයක් තිබේ. මෙම අලෙවිසැල් මගින් නැවුම් එළවළු සහ පළතුරු මෙන්ම සීග්‍රයෙන් අලෙවි වන භාණ්ඩ (FMCG) අලෙවි කරනු ලබයි. සමාගමට මධ්‍යම පළාතේ අක්කර තුනක ගොවිපොළවල් ඇති අතර, එම ගොවිපොළවල්වල සිට බස්නාහිර පළාතේ ඇති අලෙවිසැල් 40 ට එහි නිෂ්පාදිත බෙදාහරිනු ලබයි. **සීමාසහිත Refresh සමාගමේ** සුපිරි වෙළෙඳසැල් සමූහය මගින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීම තහවුරු කිරීම පිණිස දේශීය සහ විදේශීය වෙළෙඳ සන්නාම යටතේ ඇති භාණ්ඩ (branded goods) අලෙවි කරනු ලබයි. **සීමාසහිත Refresh සමාගමේ** බහුතරයක් ගෙවීම් චෙක්පත් මගින් සිදුකරයි.

**සීමාසහිත Refresh සමාගම,** තමන්ගේම ප්‍රවාහන සේවයක් පවත්වා නොගන්නා අතර, ඒ වෙනුවට අන්තර්ජාල යෙදවුමක් හරහා නැවුම් එළවළු සහ පළතුරු ප්‍රවාහනයට අවශ්‍යවන වාහන කුලී පදනම මත ලබාගනී. මෙම ක්‍රියා පටිපාටිය ආයතනයේ ප්‍රවාහන පිරිවැය අවම කිරීමට හේතුවනු ඇති බවට එහි කළමනාකාරීත්වය අදහස් කරයි. නමුත් බොහෝ අවස්ථාවන්හිදී මෙම බාහිරින් ලබාගත් බෙදාහැරීමේ රියැදුරන්ගේ සේවය ගුණාත්මක බවින් අඩු බවට අලෙවිසැල් කළමනාකරුවන් විසින් චෝදනා කරනු ලැබේ. මෙම දුර්වල ප්‍රවාහන ක්‍රමවේදය හේතුවෙන් එළවළු සහ පළතුරු අපතේ යාම් සමාගමේ ඉතා විශාල පිරිවැයක් බවට මෑත වර්ෂවලදී පත්ව ඇත. එමනිසා ආයතනයේ කළමනාකරණය එළවළු හා පළතුරු ප්‍රවාහනය සඳහා නව බෙදාහැරීමේ රථ දෙකක් මිලට ගැනීමට සැලසුම් කරමින් සිටී.

**සීමාසහිත Refresh සමාගමේ** සියලුම මුදල් අයකැමිවරුන් හරපත් සහ බැරපත් ගෙවීම් බාර ගැනීමට අවශ්‍ය ස්වයිප් යන්ත්‍ර (swipe machines) වලින් සන්නද්ධව සිටී. කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වයත් සමඟ, සමාගමේ වෙබ් අඩවිය මාර්ගගත ගෙවීම් පහසුකම් සහිතව සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීමට කළමනාකාරීත්වය සැලසුම්කොට ඇත. මෙමගින් සමාගමේ සියළුම අලෙවිසැල්වලට එකිනෙක සමඟ ජාලගතවීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරික මෙහෙයුම්වලදී විද්‍යුත් සන්නිවේදන විකල්ප භාවිත කිරීමට හැකියාව ලැබෙනු ඇත. සමාගමට අළුතින් බඳවාගත් තොරතුරු තාක්ෂණ කළමනාකරු (IT manager) විසින් සියලුම සැපයුම් දාම ක්‍රියාකාරකම් (supply chain activities), ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP system) හරහා සැලසුම් කොට ඇති වෙබ් අඩවිය හා ඒකාබද්ධ කිරීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Refresh සමාගම** විසින් විද්‍යුත් වාණිජ්‍යය (E-commerce) එහි ව්‍යාපාර මෙහෙයුම් සඳහා යොදාගන්නා ආකාර (ways) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් මගින් **සීමාසහිත Refresh සමාගමට** ලබාගතහැකි හැකි වාසි (advantages) හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(c) හොඳ ප්‍රවාහන පද්ධතියක ගුණාංග (qualities) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(d) මුදල් භාවිතයට වඩා චෙක්පත් භාවිතය වාසිදායක ලෙස සැලකීමට හේතු (reasons) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(e) **සීමාසහිත Refresh සමාගම** භාවිත කළ හැකි විද්‍යුත් සන්නිවේදන කටයුතු සඳහා උදාහරණ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂි ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |